(211)

දුරකථන /தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ......................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.

'இசுருபாய'
பத்தரமுல்ல.

"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எனது இல. / My No. } ඊඩී /1/09/1/1/04 (i)

දිනය / திகதி / Date } 2008.12. 05

චක්‍රලේඛ අංක : 2008/49

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම පාසල් ප්‍රධානීන් (ප්‍රාථමික පංති පැවැත්වෙන පාසල්වල) වෙත

## ප්‍රාථමික අධ්‍යාපනයේ තෙවන ප්‍රධාන අවධිය ( 5 ශ්‍රේණිය) සඳහා නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම.

2007 වර්ෂයේ සිට ක්‍රියාත්මක විෂයමාලා ප්‍රතිසංස්කරණවලට අනුව ප්‍රාථමික අධ්‍යාපනයේ පළමු ප්‍රධාන අවධිය (1 හා 2 ශ්‍රේණි) සඳහා 2007 වර්ෂයේ සහ දෙවන ප්‍රධාන අවධිය (3 හා 4 ශ්‍රේණි) සඳහා 2008 වර්ෂයේ හඳුන්වා දුන් නව විෂයමාලා ක්‍රියාත්මක වෙමින් පවතී. ප්‍රාථමික අධ්‍යාපනයේ තෙවන ප්‍රධාන අවධිය (5 ශ්‍රේණිය) සඳහා විෂයමාලා ප්‍රතිසංස්කරණ 2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක කළ යුතු වේ.

02. ඒ අනුව 1998 ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වන අංක HRD/EQD/2002/28 හා 2002.11.08 දිනැති චක්‍රලේඛයට අමතර වශයෙන් මේ චක්‍රලේඛය 2009 වසරේ ජනවාරි පළමු වන දින සිට ක්‍රියාත්මක කෙරේ.

03. තෙවන ප්‍රධාන අවධියේ දී එක් එක් විෂය සඳහා සතියකට නියමිත කාලය පහත දැක්වෙන පරිදි විය යුතු ය.

| විෂයය | සතියකට කාලය |
|---|---|
| 01. මව්බස | පැය 5.00 |
| 02. ගණිතය | පැය 5.00 |
| 03. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 7.30 |
| 04. ඉංග්‍රීසි | පැය 3.30 |
| 05. දෙවන ජාතික භාෂාව | පැය 1.00 |
| 06. ආගම | පැය 2.00 |
| 07. උදය රැස්වීම හා ආගමික වතාවත් | පැය 1.15 ( දිනකට මිනිත්තු 15 බැගින්) |
| 08. විවේක කාලය | පැය 1.40 ( දිනකට මිනිත්තු 20 බැගින්) |
| 09. ශරීර සුවතා ක්‍රියාකාරකම් | පැය 2.05 ( දිනකට මිනිත්තු 25 බැගින්) |
| 10. විෂය සමගාමී ක්‍රියාකාරකම් | මිනිත්තු 30 (සතියේ එක් දිනක) |
| 11. වෛකල්පික ක්‍රියාකාරකම් | මිනිත්තු 30 |
| 12. සතියකට මුළු කාලය | පැය 30.00 |

04 ඉංග්‍රීසි විෂය සහ ඇතැම් විට ආගම විෂය ඉගැන්වීමට වෙනත් ගුරුවරයකු යොදා ගන්නා අවස්ථා හැර සියලු ම විෂයයන් එක ම ගුරුවරයෙකු විසින් ඉගැන්විය යුතු ය.

05 මේ අනුව පස්වන ශ්‍රේණියේ දිනකට වැඩ කරන කාලය පැය 06කි. එනම් පෙ. ව. 7.30 ට ආරම්භ වී ප. ව. 1.30 ට අවසන් වන ලෙස දැනට ක්‍රියාත්මක වන තෙවන ප්‍රධාන අවධියේ පංති පැවැත්වෙන කාලයෙහි වෙනසක් නොමැත.

06 පස්වන ශ්‍රේණිය සඳහා මෙතෙක් භාවිත වූ ගුරු අත් පොත් වෙනුවට ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙන ලද පහත සඳහන් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ 2009 වසරේ සිට භාවිත කළ යුතු ය.

1. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය (සිංහල මාධ්‍ය )
    - මව්බස (සිංහල)
    - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
    - ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි
    - දෙවන ජාතික භාෂාව (දෙමළ)
    - තක්සේරු කිරීම.
2. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය (දෙමළ මාධ්‍ය )
    - මව්බස (දෙමළ)
    - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
    - ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි
    - දෙවන ජාතික භාෂාව (සිංහල)
    - තක්සේරු කිරීම.
3. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය (සිංහල මාධ්‍ය) ගණිතය
4. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය (දෙමළ මාධ්‍ය) ගණිතය

07 බුද්ධ ධර්මය, හින්දු ධර්මය, කතෝලික ධර්මය, ක්‍රිස්තු ධර්මය, ඉස්ලාම් ධර්මය යන ආගම් සඳහා දැනට ක්‍රියාත්මක වන ගුරු අත්පොත් තව දුරටත් නොවෙනස් ව ක්‍රියාත්මක විය යුතු ය.

08 දැනට ක්‍රියාත්මක වන පස්වන ශ්‍රේණියට අදාළ ඉංග්‍රීසි ගුරු අත්පොත තව දුරටත් නොවෙනස් ව ක්‍රියාත්මක විය යුතු ය.

09 දිනපතා මිනිත්තු 25ක් ක්‍රියාත්මක කළ යුතු ශරීර සුවතා වැඩසටහන සඳහා අධ්‍යාපන අමාත්‍යංශය හා ජාතික අධ්‍යාපන ආයතනය එක් ව සකස් කරන ලද "ක්‍රියාකාරී ව ප්‍රීතිමත් වෙමු" තුන්වන, හතරවන හා පස්වන ශ්‍රේණි (දෙවන හා තෙවන ප්‍රධාන අවධි) නමැති පොත භාවිත කළ යුතු ය.

10 දැනට ක්‍රියාත්මක වන පස්වන ශ්‍රේණියට අදාළ මව්බස, ඉංග්‍රීසි, ගණිතය හා ආගම් පෙළ පොත් නොවෙනස් ව තව දුරටත් 2009 වර්ෂයේ සිට ඒ අයුරින් ම ක්‍රියාත්මක විය යුතු ය.

11 1998 වර්ෂයේ සිට හඳුන්වා දුන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව පස්වන ශ්‍රේණිය සඳහා 2003 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන මේ චක්‍රලේඛය මගින් වෙනස් නොවූ සියලු වැඩසටහන් ඉදිරියටත් ඒ අයුරින් ම ක්‍රියාත්මක විය යුතු ය.

එස්.යූ. විජේරත්න
වැඩ බලන අධ්‍යාපන ලේකම්
අධ්‍යාපන අමාත්‍යංශය